# ආර්ථික ගැටලුවේ මූල කොතැනද ?

**ආර්. ඒ. ජයවීර, වරලත් ගණකාධිකාරී**

අපේ රට ප්‍රීතිමත් ජනතාවකගේ වාස භූමිය වන සුව පහසු රටක් බවට පත් කර ගැනීමේ කාර්යභාරය හා වගකීම පැවරෙන්නේ අපටමය. මැතිවරණයකදී ඡන්දය ප්‍රකාශ කිරීමෙන් සියලුම ප්‍රශ්න විසඳීමට භාර ගන්නා ගැලවුම්කාරයෙකු හෝ කොන්ත්‍රාත්කාරයෙකු සොයන්නෝ ප්‍රීතිමත් ජනතාවකගේ වාසභූමිය කරගත හැකි සුව පහසු අනාගත ශ්‍රී ලංකාව නොදකින්නාහ.

දේශපාලනඥයකු/ මන්ත්‍රීවරයෙකු වීමට අධ්‍යාපන සහතික අවශ්‍ය ද? හොර-බොරු-වංචා-දූෂණ වලටත් රට ආර්ථික ආගාධයකට වැටීමටත් හේතුව අධ්‍යාපන සහතික නැති පිරිසක් පාර්ලි මේන්තුවට යාම යැයි ඇතැමෙක් කියති. මෙය සම්පූර්ණයෙන්ම වැරදි අදහසකි. සහතිකවලින් මනින අධ්‍යාපන සුදුසුකම් වලින් කෙළපැමිණි පුද්ගලයින් අතින් ද අවකල්ක්‍රියා සිදුවී තිබේ. ඔවුන් අතින් සිදුවන අවකල්ක්‍රියාවන්හි බරපතළකම වැඩිය. සමත් වී තිබෙන විභාග, ආචාර්ය උපාධි හා මහාචාර්ය පදවි, දේශපාලනඥයකු වීමට ඒකායන සුදුසුකමක් නොවන්නේය. නුසුදුසු කමක්ද නොවන්නේය. පාර්ලිමේන්තුවට හෝ වෙනත් මහජන නියෝජිත සභාවකට මන්ත්‍රීවරුන් තෝරා පත් කර ගැනීමේදී බැලිය යුත්තේ කෙනෙකු සමත් වී තිබෙන විභාග ලැයිස්තුව නොව ඔහුට තිබෙන ව්‍යවහාරික දැනුම, රටත් ලෝකයත් ගැන තිබෙන පොදු දැනුම, මහජනයා සමඟ මෙන්ම විශේෂඥ දැනුමැති පුද්ගලයින් සමඟ ඉවසිලිවන්තව හා සංවේදීව වැඩ කිරීමට ඇති හැකියාව, දේශපාලන පරිචය සහ තමාගේ හොඳ නම (කීර්තිය) ගැන දක්වන සැලකිල්ලය.

## මහා ආර්ථික ගැටළුව

අප මුහුණ පා සිටින අගාධගාමී මහා අර්බුදය දශක කීපයක් තිස්සේ ගොඩනැගුන විදේශ විනිමය ගැටළුව, රාජ්‍ය අය-වැය ගැටළුව, ණය උගුල, ආදායම් විෂමතා ගැටළුව, කෘෂිකාර්මික ගැටළුව, දේශපාලන අර්බුදය හා ආණ්ඩුක්‍රම අර්බුදය යන ගැටළු, උගුල් හා අර්බුද ගණනාවක සංයුක්තයක් බවත්, මෙම ගැටළු, උගුල් හා අර්බුද එකිනෙක සමඟ දිගට හරහට ප්‍රතික්‍රියා කිරීමෙන් මහා ආර්ථික අර්බුදය හටගත් බවත්, මේ මහා පරිහානියට නායකයින් පමණක් නොව ලිප ගිනි මොලවන තෙක් දියකෙළි කකුළුවන් මෙන් ණයට සැප ගත් මහජනයාද සම්මාදම් වී ඇති බවත්, රට ස්ථාවර කිරීම යනුවෙන් අද කරගෙන යන්නේ ණය ආපසු ගෙවීම සහතික කෙරෙන වැඩ පිළිවෙළක් පමණක් බවත්, අයි.එම්.එෆ්. භෞතචිකිත්සක (physiotherapy) ව්‍යායාමයන් ණය ගෙවීම හා ගෝලීය ලිබරල් ආර්ථිකය දුවවීම මූලික කරගත් ඒවා මිස අපේ රට නැංවීම අරමුණු කරගත් ඒවා නොවන බවත් තේරුම්

ගෙන, අපේම වූ ගැලවීමේ මාර්ගයක් සොයා යන්නාහු, ප්‍රීතිමත් ජනතාවකගේ වාසභූමිය වන සුව පහසු අනාගත ශ්‍රී ලංකාව දකිත්මය.

## විදේශ විනිමය ගැටළුව

2022 වර්ෂයේදී ඉන්ධන, ගෑස් හා ඖෂධ වැනි අත්‍යාවශ්‍ය ආනයන සීමා කර දිගු පෝලිම් ඇති කරමින් මුළු රටටම පෙනෙන්නට සැලැස්වූයේ විදේශ විනිමය ගැටළුවේ දිග, පළල හා අවදානමයි. භාණ්ඩ හා සේවා අපනයනය හා ආනයනය, එන-යන විදේශ ප්‍රේෂණ, විදේශ ණය ගැනීම හා ගෙවීම යනාදී සෙසු ලෝකය සමඟ කරන ගණුදෙනුවල අසමතුලිත භාවයෙන්, එනම් එන විදේශ විනිමයට වඩා යන විදේශ විනිමය වැඩි වීමෙන්, විදේශ වීනිමය ගැටලුව ඇතිවේ. මෙහිදී අඩුවෙන් අවධානය යොමු වී ඇති කරුණු කීපයක් පහත දැක්වේ.

විදේශ ධනායෝජනය, සංවර්ධන උපාය මාර්ගයේ අවශ්‍යම අංගයක් ලෙස සැලකීම නිසා අප ප්‍රපාතයේ තවත් පහළට වැටෙන අවස්ථා තිබේ. උදාහරණයක් ලෙස, විදේශ ආයෝජකයින් විසින් ඉදිකරන විශාල ගොඩනැගිලිවල කුලී ආදායමත්, සුළං හා සූර්ය විදුලි බලාගාරවල ආදායමත්, මහල් නිවාස විකුණා ලබා ගන්නා මුදලුත් රටින් පිටට ගෙන යාම සඳහා ඔවුහු අපේ විදේශ විනිමය යොදා ගනිති. එමගින් විදේශ විනිමය අර්බුදය උග්‍රවේ. මෙවැනි අදූශ්‍යමාන ආනයන නිසා අප තව තවත් වල පල්ලට වැටෙන බවද, සූර්ය හා සුළං බලයෙන් විදුලිබලය උත්පාදනය කිරීම විදේශ සමාගම් වලට පැවරීමෙන් අපට පායන හිරු වෙනුවෙන් විදේශීය ආයෝජකයෙකුට මුදල් ගෙවන අවාසනාවන්ත තත්ත්වයකට අප පත්වන බවද අවබෝධ කර නොගන්නාහු, ප්‍රීතිමත් ජනතාවකගේ වාසභූමිය වන සුව පහසු අනාගත ශ්‍රී ලංකාව නොදකින්නාහ.

යම් භාණ්ඩයක් අපනයන කරනවිට, දේශීය වෙළඳපොලට කෙරෙන සැපයුම නිතැනින්ම අඩුවී එම භාණ්ඩයේ මිල ඉහළ යාමට පුළුවන. එහෙත් අපනයන ඉපයීම මගින් විදේශ විනිමය අනුපාතයට කෙරෙන සතුටුදායක බලපෑම නිසා පොදුවේ ආනයනිත භාණ්ඩ වල මිල පහළ යාමෙන් යම් කිසි හානිපූරණයක් සිදුවේ යැයි කල්පනා කළ හැකිය. එසේ වීමට නම් අපනයන ඉපයීම් විදේශයන්හි නොසඟවා මෙරටට ගෙන ආ යුතුය. සාවද්‍ය ඉන්වොයිසිතරණය (trade misinvoicing) මැඩලිය යුතුය.

අනෙක් අතට ආනයන සීමා ලිහිල් කිරීම මගින් විදේශ විනිමය අනුපාතයට කෙරෙන අහිතකර බලපෑම නිසා පොදුවේ ආනයනිත භාණ්ඩ වල මිල ඉහළ යා හැකිය. එය පොදුවේ බොහෝ දෙනා පිට පැටවෙන බරකි. මෝටර් රථ වාහන ආනයනය වැන්නකදී ප්‍රතිලාභ බුක්ති විඳින්නෝ සමාජයේ ඉහළ හා මධ්‍යම පංතියේ ටික දෙනෙකි. ඔවුන්ට රුපියල් වලින් ගෙවිය හැකි අධික තීරුබදු පැනවීමෙන් අහිතකර

ප්‍රතිවිපාක සමනය නොවේ. එබැවින් සෙසු ලෝකය සමඟ කරන ගණුදෙනු වලදී අවස්ථාවෝචිත තුලනයක් පවත්වාගෙන යාමට ක්‍රියා නොකරන්නාහු ප්‍රීතිමත් ජනතාවකගේ වාස භූමිය වන සුව පහසු අනාගත ශ්‍රී ලංකාව නොදකින්නාහ.

## රාජ්‍ය අය-වැය අර්බුදය

රජයේ වියදම ආදායමට වඩා බෙහෙවින් වැඩිය. 2022 හා 2023 වර්ෂවලදී රාජ්‍ය සේවාවේ (සිවිල් හා ආරක්ෂක) වියදම රාජ්‍ය ආදායමින් පිළිවෙලින් සියයට 48% ක් හා 31% ක් ද ණය පොලී වියදම සියයට 79% ක් හා 81% ක් ද විය. ණය පොලී වියදම ඉහළ මට්ටමක පැවතීමට එක හේතුවක් වන, ප්‍රාග්ධන ව්‍යාපෘතිවල පිරිවැය අධිතක්සේරු කර තිබීම බොහෝ අවස්ථාවල සාකච්ඡාවට ලක් වී තිබෙන කරුණකි. රටේත් මතු පරම්පරාවන්ගේත් අනාගතය පරදුවට තබන ප්‍රාග්ධන ව්‍යාපෘති සහ දිගු කාලයකින් පල දරන වෙනත් වැඩ සටහන් සඳහා මුදල් යෙදවිය යුත්තේ දැඩි නියාමනයක් හා මූල්‍ය විනයක් ස්ථාපනය කරගැනීමෙන් පසුවය. රටේ අවශ්‍යතාවට ගැලපෙන ප්‍රාග්ධන ව්‍යාපෘති පමණක් අනුමත කිරීමටත්, දූෂණය මැඩ පැවැත්විමටත් හැකි වනු පිණිස ජාතික සැළසුම් සභාවක් පිහිටුවීමට ඉදිරිපත් වන්නෝ ප්‍රීතිමත් ජනතාවකගේ වාස භූමිය වන සුව පහසු අනාගත ශ්‍රී ලංකාව දකිත්මය.

රාජ්‍ය සේවාව ගැන කථා කිරීමේදී බොහෝ දෙනෙක් අල්ලාගෙන සිටින්නේ වැරදි කොනකිනි. එනම්, එහි වියදම් පැත්තෙන් පමණකි. අප සැලකිලිමත් විය යුත්තේ වියදම හෝ රාජ්‍ය සේවක සංඛ්‍යාව ගැන නොව, වියදමට හා සේවක පිරිසට සරිලන ප්‍රතිලාභ ලබා ගැනීමට අසමත් වීම ගැනය, රාජ්‍ය සේවාවේ මුළු වියදම හා පිරිස් බලය ජාතික නිෂ්පාදිතය වර්ධනය කිරීමට නැතහොත් ගුණනය කිරීමට (multiplier effect) දායක කර ගන්නා ආකාරය ගැනය. ඉලක්ක කරා මෙහෙයවනු ලබන කාර්යක්ෂම හා කැපවුන රාජ්‍ය සේවාවකට මුළු රටේම ආර්ථික ප්‍රතිපල ඉහළ නංවා, දළ දේශීය නිෂ්පාදිතය වැඩිකර ගැනීමට දායක විය හැකිය. ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා රාජ්‍ය යාන්ත්‍රණයේ සම්පූර්ණ ව්‍යුහාත්මක පරිවර්තනයක් කිරීමට පෙරමුණ ගන්නෝ ප්‍රීතිමත් ජනතාවකගේ වාසභූමිය වන සුව පහසු අනාගත ශ්‍රී ලංකාව දකිත්මය.

අති විශාල ලාභ අන්තර්ගත මිල ගණන් වලට ප්‍රසම්පාදනයද ඇතුළු රජයේ කොන්ත්‍රාත් ලබා ගන්නෝ අධි ලාභ - සුපිරි වාසනා දිනා ගන්නෝය. අරපිරිමැස්ම හා වැඩ කිරීමේ විනය බිඳ දමන ඔවුහු ''නොමසුරු'' ලෙස හිතුමතේ වියදම් කර තමනුත් ඇද වැටී රටත් ආගාධයට ඇද දමති. ජාතික ආර්ථික දේහයේ ඔරලෝසු කටු බලහත්කාරයෙන් කරකවති. සාමාන්‍ය ලාභ සහිතව වෙළඳපොල නියාමනයන්ට අනුව වැඩ කරන ව්‍යාපාරික ප්‍රජාවද, ඔවුන්ගේ ඔරලෝසුවට අනුව වෙලාව තබාගන්නා තැනට පත් කරති. ඔරලෝසුවේ කටු බලහත්කාරයෙන් කරකවන්නන් මැඩ පැවැත්වීමට පෙරමුණ ගන්නෝ ප්‍රීතිමත් ජනතාවකගේ වාස භූමිය වන සුව පහසු අනාගත ශ්‍රී ලංකාව දකිත්මය.

**රාජ්‍ය ආදායම් අධිකාරිය**

ශ්‍රී ලංකා ආණ්ඩුව ණය උගුලක පැටලීමට එක හේතුවක් වූයේ වර්තන වියදම් (එදිනෙදා වියදම්) පියවා ගැනීමටවත් නොහැකි වන තරමට, රාජ්‍ය ආදායම් පිරිහී යාමයි. (එනම්, එදා වේල පිරිමසා ගැනීමටවත් නොහැකි වීමයි). රාජ්‍ය ආදායම් වැඩි කර ගත හැකි තිරසාර මාර්ගය වන්නේ ජාතික ආදායම (National income) වැඩි කර ගැනීමයි. දැනට තිබෙන්නාවූ ආදායමින් වැඩිපුර බදු ගන්නට යාම, ආර්ථිකය අබලන් වීමට හේතුවකි. මෙහිදී කෙනෙකුට සිහිපත් වන්නේ රන් බිජු දැමූ lsls<shගේ කථාවය.

බදු ආදායම, ජාතික ආදායමේ ප්‍රතිශතයක් ලෙස පහළ මට්ටමකට වැටීමට බලපෑ ප්‍රමුඛ හේතු දෙකක් වන්නේ ආර්ථිකයේ ව්‍යුහය සහ බදු සහනය. මේවා සමස්ත ආර්ථික ප්‍රතිපත්තිය යටතට වැටෙන කරුණුය. එම තත්ත්වයන්ට ඉඩ හැරීමෙන් පසුව වුවද අය කරගත යුතුව තිබුණ රාජ්‍ය ආදායම අය කරගැනීමට නොහැකිවී ඇත්තේ එක් පැත්තකින්, රාජ්‍ය අදායම් එකතු කිරීම භාරව සිටින දෙපාර්තමේන්තුවල අකාර්යක්ෂමතාව, අක්‍රමිකතා සහ දූෂණයත්, අනෙක් පැත්තෙන් බදු මගහැරීම සහ පැහැර හැරීමත් නිසාය. රාජ්‍ය ආදායම් එකතු කිරීමට සම්බන්ධ සියලු දෙපාර්තමේන්තු හා ආයතන, අධීක්ෂණය හා නියාමනය කිරීමටත් සාවද්‍ය ඉන්වොයිසිකරණය වැනි බදු මගහරින ක්‍රම නියාමනය කිරීමටත් රාජ්‍ය ආදායම් අධිකාරියක් පිහිටුවා ගැනීමටත්, අවංකව හා නොබියව වැඩ කිරීමට හැකි වනු පිණිස එහි සාමාජිකයින්ගේ පත්වීම් ව්‍යවස්ථාදායක සභාවේ නිර්දේශයෙන් කර ගැනීමටත්, ක්‍රියා කරන්නෝ ප්‍රීතිමත් ජනතාවකගේ වාස භූමිය වන සුව පහසු අනාගත ශ්‍රී ලංකාව දකිත්මය.

**ණය උගුල**

ණය උගුලේ යටි සූත්තරය වන්නේ ‘දියුණු’ රටවල් විසින් ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කර ඒවා කරගෙන යාමට අවශ්‍ය ණය මුදල ලබා දී ඒවායේ කොන්ත්‍රාත් ඔවුන්ටම ලබා ගැනීමයි. මෑතක සිට මේ ණය මුදල තබා ගන්නේ ද එම රටේම බැංකුවකය. ව්‍යාපෘතිය භාර මෙරට ආයතනය විසින් කරන ලද වැඩ සහතික කළ පසුව, එම බැංකුව විසින් කොන්ත්‍රාත්කාර සමාගමට මුදල් ගෙවීම් කරයි. නොයෙකුත් හේතු කාරණා පදනම් කරගෙන අප විසින්ම අටවාගෙන ඇති ණය උගුලෙන් ගැලවීමට ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ (අයි.එම්.එෆ්.) සරණ පැතීමට සිදුවී ඇත. වැඩි කල් නොයා මේ සරණ බන්ධනයෙන් ගැලවෙන්නට වුවමනාය. එහෙත් ඒ සඳහා වන කිසිදු සැලැස්මක් අප ඉදිරියේ නැත. අයි.එම්.එෆ්. වට්ටෝරුවේ තිබෙන අපගේ ආර්ථික සෞඛ්‍යයට හා මූල්‍ය විනය පවත්වාගෙන යාමට හිතකර ඇතැම් භෞතචිකිත්සක (physiotherapy) ප්‍රතිකාර අපටම කරගත හැකිය. අපගේම මාවතක ගමන් කිරීම සඳහා අයි.එම්.එෆ්. කසාදය කටුගා දැමීමටත්, ණය උගුලෙන් ගැලවීමටත් අධිෂ්ඨාන සහගත වන්නාහු ප්‍රීතිමත් ජනතාවකගේ වාස භූමිය වන සුව පහසු අනාගත ශ්‍රී ලංකාව දකිත්මය.

## ශුභසාධනය ද? වන්දි ගෙවීම ද?

අපේ අවධානය හා සම්පත් යෙදවිය යුතු ප්‍රමුඛ කාර්යයක් වන්නේ දේශීය පරිභෝජනය සඳහා දේශීය නිෂ්පාදිතය වැඩි කිරීමයි. දරිද්‍රතාවේ ගිලී ඇති 45%ක පිරිස විශේෂයෙනුත්, මුළු ජනගහණයම පොදුවේත් ආරක්ෂා කරගත හැක්කේ එමගිනි. ජී.වී.එස්. ද සිල්වා මහතාගේ Some Heretical Thoughts on Economic Development (1973) හි දක්වා ඇති අදහස් වල තත්කාලීන පරිවර්තනය වන්නේ එයයි. අපනයනය හා ඩොලර් ඉපැයීම ගැනම කථා කරන බොහෝ දෙනා ඉතා පහළ මට්ටමක පවතින දේශීය පරිභෝජනය ඉහළ නැංවීම පිණිස දේශීය නිෂ්පාදිතය වැඩි කිරීම ගැන කථා නොකරති. බහුතරයක් වූ අඩු ආදායම් ලාභීන්ට "ලද දෙයින් සතුටු වන්න" යන බණ පදය දිගින් දිගටම දේශනා කළ නොහැකිය. ඔවුන්ට සමාජ සාධාරණය ඉෂ්ඨ කිරීමටත්, ප්‍රීතිමත් ජනතාව සමඟ සම අසුන් ගැනීමටත්, හැකිවන්නේ දේශීය පරිභෝජනය ගාමක බලය බවට පත්කර ගනිමින් දේශීය නිෂ්පාදිතය වැඩි කිරීමෙන් බව අවබෝධ කර නොගන්නාහු ප්‍රීතිමත් ජනතාවකගේ වාස භූමිය වන සුව පහසු අනාගත ශ්‍රී ලංකාව නොදකින්නාහ.

සියළු ජනයා පංගුකාරයින් කරනු නොලැබූ අසාර්ථක ආර්ථික සංවර්ධනය හේතුවෙන් ජනගහනයෙන් සැලකිය යුතු ප්‍රමාණයකට නොයෙක් සහනාධාර සහ දීමනා ගෙවීමට සිදුවී තිබේ. ජනසවිය, සමෘද්ධිය, අස්වැසුම යනුවෙන් කලින් කළ හඳුන්වනු ලැබූ මේ සහනාධාර සැලකිය යුත්තේ ශුභසාධන දීමනා ලෙස නොව අසමත් රාජ්‍යයක් විසින් ජනගහනයේ ඇතැම් කොටස්වලට ගෙවන වන්දියක් ලෙසටය. අයි.එම්.එෆ්. වැනි ජාත්‍යන්තර ආයතන සමඟ එළඹෙන ගිවිසුම් වලදීත් මේ වන්දි ගෙවීම (සහනාධාර) ගැන සඳහන් වේ. එයින් පෙනෙන්නේ මේ වන්දි ගෙවීම ගෝලීය ආර්ථිකයේ අනිවාර්ය අංගයක් බවට ඔවුන් විශ්වාස කරන බවය. දිළිඳු බව ඔවුන්ගේ න්‍යාය පත්‍රයේ ස්ථිර අයිතමයක් බවය. ඔවුන්ගේ වැඩ පිළිවෙළ මගින් කිසිදාක දිළිඳුකම නැති කළ නොහැක. ශුභාසාධනයට පාත්‍ර වන අත පල්ලෙන් වැටුන ජනකායක් දිළිඳු බව පිටුදැකීමේ ප්‍රලාප වලින් දිගින් දිගටම රවටනවා වෙනුවට හැම පුරවැසියෙකුටම ආත්මාභිමානයෙන් ජීවත් විය හැකි සංවර්ධන ක්‍රමෝපායන් සැළසුම් කරන්නෝ ප්‍රීතිමත් ජනතාවකගේ වාස භූමිය වන සුව පහසු අනාගත ශ්‍රී ලංකාව දකිත්මය.

1948 න් පසුව, ස්වාධීන, ස්වෛරී, සංවර්ධිත, රාජ්‍යක් බවට පත්වීම වෙනුවට අපි ක්‍රම ක්‍රමයෙන් නව ආකාරයක විජිතවාදයකට යටත් වී ඇත්තෙමු. සියලු ගැටලුවල මුල එතැනය. "අන්තෝ ජටා බහි ජටා - ජටාය ජටිතා පජා". ඇතුළතත් ගැටය . පිටතත් ගැටය. මුළු ප්‍රජාවම අවුලෙන් වෙළී සිටී. එහෙත් ලෙහන්නට බැරි ගැටයක් (Gordian knot) නැති බව අපි ඒකාන්තයෙන්ම දන්නෙමු.